පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

කළමනාකරණ සහ සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන සාමාසික පරීක්ෂණය - 2019
முகாமைத்துவ அபிவிருத்தி டிப்ளோமா பாடநெறி – இரண்டாம் அரையாண்டு – 2019

# DM 21 – ව්‍යවසායකත්වය

කාලය :- පැය 03 යි
ඕනෑම ප්‍රශ්න හතරක් (4) සඳහා පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (6) සමන්විතය.

මුළු ලකුණු 60

---

01. (අ) "ව්‍යවසායකයා යනු වෙනස හඳුන්වා දෙන නියෝජිත වරයෙකි (change agent)." පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ආ) විවිධ සේවා ව්‍යවසායන් වර්ගීකරණය කර ඒවායේ සාර්ථකත්වය සඳහා බලපාන සාධක විමසන්න.

(ලකුණු 05)

(ඇ) ව්‍යාපාර ජීව චක්‍රයේ විවිධ අදියර සඳහා අවශ්‍ය වන ව්‍යවසායකත්ව උපක්‍රම මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 15)

02. (අ) ව්‍යාපාරයේ ස්වභාවය එහි මූල්‍ය සම්පාදන ප්‍රභවයන් (financial source )යොදාගැනීම සඳහා බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) ව්‍යවසායකයන් සඳහා අවස්ථාවන් ගොඩනැගෙන පරිසර සාධක ශ්‍රී ලංකාව ඇසුරෙන් උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 15)

03. (අ) නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලිය විස්තර කරන්න.

(ලකුණු 04)

(ආ) විවිධ තාක්ෂණික මට්ටම් හඳුන්වා දී එම මට්ටම් වලදී ව්‍යවසායකත්ව කාර්යභාරය වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ) පේටන්ට් බලපත්‍රය, වෙළඳ ලකුණ සහ ප්‍රකාශන අයිතිය සඳහා අදාල නිෂ්පාදන ආරක්ෂණය සම්බන්ධව බුද්ධිමය දේපල ආරක්ෂණ ක්‍රමවේදය යොදාගනිමින් විස්තර කරන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 15)

04. (අ) දැනටමත් පවත්වාගෙන යන digital ඡායාරූපකරණය සම්බන්ධ ව්‍යාපාරයක් මිලදීගැනීමට ජෝජ් අදහස් කරයි. මේ සඳහා වන ව්‍යාපාර මූල්‍ය ප්‍රකාශන ආදියද ඔහු අධ්‍යනය කර ඇත. අළුතින් ව්‍යාපාරයක් ආරම්භ කරනවාට වඩා පවතින ව්‍යාපාරයක් මිලදීගැනීම සම්බන්ධව ඔබ ජෝජ්ට කුමන උපදෙස් ලබාදෙන්නේද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යවසායකයෙක් ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට අදහස් කරයි. පහත සඳහන් අංශ ඔස්සේ ඔබගේ අදහස් පැහැදිලි කරන්න.

I. ව්‍යාපාර සැලැස්මක ස්වභාවය.
II. ව්‍යාපාර සැලැස්මක් පරිහරණය කරන පාර්ශව.
III. ව්‍යාපාර සැලැස්මක ප්‍රයෝජන.
IV. ව්‍යාපාර සැලැස්මක මූලිකාංග.

(ලකුණු 10)
(මුළු ලකුණු 15)

05. (අ) නවෝත්පාදන(innovation) ක්‍රියාවලියේ පියවර විස්තර කරන්න.

(ලකුණු 04)

(ආ) ව්‍යවසායකත්වය සඳහා වැදගත්වන සංකල්පයක් ලෙස නවෝත්පාදන(innovation) සැලකෙන්නේ ඇයි? පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) "අධි ස්පර්ශක" (high touch) සහ අධි තාක්ෂණික (high tech) සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. අධි ස්පර්ශක සංකල්පය ව්‍යාපාර සාර්ථකත්වය සඳහා බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 07)
(මුළු ලකුණු 15)

06. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා තුනක් සඳහා කෙටි සටහන් ලියන්න.

I. ව්‍යවසායකත්ව ජාලගතවීමේ ප්‍රයෝජන.
II. ව්‍යවසායකත්ව කණ්ඩායම්.
III. කුඩා ව්‍යාපාර සහ ව්‍යවසායකත්වය.
IV. ව්‍යවසායකත්ව වෙළඳපල.
V. ව්‍යවසායකත්ව සම්බන්ධව ගොඩනැගෙන නව ප්‍රවනතා.

(ලකුණු 05*3)
(මුළු ලකුණු 15)